# තොරතුරු මහජන අයිතියකි; ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් ශක්තිමත් මාධ්‍යකරණයක්

## ලෝක ජනමාධ්‍ය නිදහස් දිනය 2021

ශ්‍රී ලංකා පුවත් පත් ආයතනය මෙවර *"තොරතුරු මහජන අයිතියකි"* යන තේමාව යටතේ ලෝක ජනමාධ්‍ය නිදහස් දිනය 2021 මැයි මස 3 වැනි දින සමරනු ලබයි. ඊට සමගාමීව මෙවර යුනෙස්කෝ වින්ඩ් හොක් ප්‍රකාශය සම්මත කිරීමේ තිස් වැනි සමරුව යෙදී ඇත.

නිදහස් ස්වාධීන හා බහුවිධ, මාධ්‍ය සංවර්ධනය උදෙසා වූ වින්ඩ්හොක් ප්‍රකාශනය සම්මත වී තිස්වසරක් සම්පූර්ණ කරන මේ වසර වනවිට ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහස පිළිබඳ අපගේ ම මූලික මාර්ගෝපදේශන ලියවිල්ල වශයෙන් සැළකෙන මාධ්‍ය නිදහස හා සමාජ වගකීම පිළිබඳ කොළඹ ප්‍රකාශය (1998) කෙරෙහි ද වින්ඩ්හොක් ප්‍රකාශනයේ ආලෝකය වැටී තිබේ.

මෙම වසරේ තේමාව මාධ්‍ය සාක්ෂරතාවය හා තොරතුරු නිවැරදිව භාවිතයේ වැදගත්කම වඩාත් ඉහළ තලයකට රැගෙන යාම තුළින් ජනමාධ්‍යවේදය මහජනතාවට තොරතුරු දැනගැනීමට අයිතියක් ලෙස ස්ථාපිත කිරීම අරමුණු කරගනී. "තොරතුරු මහජන අයිතියකි; ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් ශක්තිමත් මාධ්‍යකරණයක්" යන තේමාව යටතේ පුවත්පත් කලාවේ වෘත්තීයභාවය ඉහළ නැංවීමට සහ මාධ්‍ය නිදහස ප්‍රවර්ධනය කිරීමට උත්සාහ කිරීමේදී වඩා ඵලදායී ප්‍රජාතන්ත්‍රවාදයක් ස්ථාපිත කිරීම සඳහා විශ්වාසදායක තොරතුරු හුවමාරු කරගන්නා දැනුවත් සමාජයක් අවශ්‍යකරන බව ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයේ පිළිගැනීම වේ.

මෙම පණිවිඩය මහජනයා වෙත රැගෙන යාමේදී ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය පාත්ෆයින්ඩර් පදනම හා එක්ව 2021 ලෝක ජනමාධ්‍ය නිදහස් දිනයට සමගාමීව මාර්ගගත සම්මන්ත්‍රණයක් පැවැත්වීමට කටයුතු සූදානම් කර තිබේ. මහජන අයිතිවාසිකමක් ලෙස තොරතුරු වෙත ප්‍රවේශවීම ප්‍රවර්ධනය කිරීමේ වැදගත්කම මෙම සම්මන්ත්‍රණයේදී සාකච්ඡාවට ලක් කෙරේ.

මෙම පණිවිඩය මහජනයා වෙත රැගෙන යාමේදී ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය හා පාත්ෆයින්ඩර් පදනම හා එක්ව 2021 ලෝක ජනමාධ්‍ය නිදහස් දිනයට සමගාමීව මාර්ගගත සම්මන්ත්‍රණයක් පැවැත්වීමට කටයුතු සූදානම් කර තිබේ. මහජන අයිතිවාසිකමක් ලෙස තොරතුරු වෙත ප්‍රවේශවීම ප්‍රවර්ධනය කිරීමේ වැදගත්කම මෙම සම්මන්ත්‍රණයේදී සාකච්ඡාවට ලක් කෙරේ. මෙම සාකච්ඡා මණ්ඩපයේදී මූලික වශයෙන්ම "තොරතුරු අයිතිවාසිකමෙහි වර්තමාන වාසි හා අනාගත ප්‍රමුඛතා" "තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම: සංවර්ධන ප්‍රමුඛතා සහ අක්‍රමිකතා හෙළිදරව් කිරීම" "තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම; පෞද්ගලිකත්වය සහ දත්ත ආරක්ෂණය" යන මාතෘකා පිළිබඳ කථිකයන් සිය අවධානය යොමුකරනු ඇත. සංවාද මණ්ඩපය මෙහෙයවනු ලබන්නේ මාධ්‍යවේදී වරුණ කරුණාතිලක ය.

මෙහිදී ප්‍රධාන මෙම මාර්ගගත සම්මන්ත්‍රණයට සූම් තාක්ෂණය ඔස්සේ 2021 මැයි 3 වැනි දින ප.ව 3.30ට පැවැත්වේ. ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයේ නිල වෙබ් අඩවියෙන් (https://slpi.lk/) හෝ ෆේස්බුක් හා ට්විටර් පිටුවලින් ඔබට වැඩිදුර තොරතුරු දැනගැනීමට හැකිය.



*සාකච්ඡා මණ්ඩලයේ සමාජිකයින් වමේ සිට දකුණට, 1 වන පේළිය- යශ්වර්ධන් කුමාර් සිංහා, ප්‍රධාන තොරතුරු කොමසාරිස්, මධ්‍යම තොරතුරු කොමිසම, නව දිල්ලිය, ඉන්දියාව. කිෂාලි පින්ටෝ-ජයවර්ධන, තොරතුරු කොමසාරිස්, ශ්‍රී ලංකා තොරතුරු දැනගැනීමේ කොමිසම. අශ්විනී නෙටේසන්, ස්වාධීන පර්යේෂිකාල ශ්‍යාමලාල් යාදේව්,  ජ්‍යෙෂ්ඨ සංස්කාරක (ගවේශනාත්මක අංශය) , ඉන්දියන් එක්ස්ප්‍රස්.*

*2 පේළිය- ජයන්ත ප්‍රනාන්දු, අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා හදිසි තොරතුරු සූදානම් ඒකකය, සාමාන්‍යධිකාරී, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය. එම්. ශ්‍රීධර්, හිටපු කොමසාරිස්, මධ්‍යම තොරතුරු කොමිසම, ඉන්දියාව.*